# මුහුණට මුහුණ

## ශ්‍රීනාත් මද්දුමගේ

''**ගායකයෙක්** විදිහට ඉස්සරහට එන්න මට හැකියාව ලැබුණේ මගේ තාත්තා නිසයි'' හේමන්ත ඩයස් නම් වන තරුණ ගායන ශිල්පියා සමඟ සන්නස වෙනුවෙන් කළ කතා බහ ඇරඹුනේ එහෙමයි.

**හේමන්ත**
මට ගීත ගායනා කරන්න අසාවක් ඇතිවුණේ අපේ තාත්තා නිසයි. තාත්තා ව්‍යාපාරිකයෙකු වුවත් සංගීතයට පුදුම ලැදියාවක් දැක්වූ අයෙක්. ඉස්සර අපේ ගෙදරට නිතරම මිල්ටන් පෙරේරා සුජාතා අත්තනායක නන්දා මාලිනී සරත් සන්දනායක තිලක් කරුණාතිලක ඇල්ප්‍රඩ් පෙරේරා වැනි ප්‍රවීණ ගායක ගායිකාවන් නිතරම ආවා ගියා. අපේ තාත්තාට හොඳට තබ්ලාව වයන්න පුලුවන්. ඒව බලන් ඉඳලා තමයි මටත් මේ හැකියාව සහ ආසාව ඇති වුණේ.

**ශ්‍රීනාත්**
පළමුවෙනි ගීතය ගායනා කළේ මොන කාලෙද?
**හේමන්ත**
මම මුලින්ම ගීතයක් ගායනා කළේ 1978 ශ්‍රී ලංකා ගුවන් විදුලියේ සොඳුරු සෙවන වැඩ සටහනටයි. තාත්තා තමයි මාව එක්කන් ගියේ. ඒ පාසල් යන කාලයේ.

**ශ්‍රීනාත්**
ඔබ ගිය පාසල?
**හේමන්ත**
මම ගියේ ආනන්ද මහා විද්‍යාලයට.
**ශ්‍රීනාත්**
ආනන්දයේදී සංගීතයට යොමු වුණේ නැද් ද?
හේමන්ත
විශේෂයෙන් යොමු වුණේ නැහැ. . නමුත් පාසලේ විවිධ ප්‍රසංග වලට කලා උළෙල වලට මම ගීත ගායනා කළා.

**ශ්‍රීනාත්**
නාට්‍ය වල රඟපෑවෙ නැද්ද?
**හේමන්ත**
නැහැ. . නාට්‍ය වල රඟ පෑවෙ ඔස්ට්‍රේලියාවට ආවට පස්සෙ.
**ශ්‍රීනාත්**
ඔස්ට්‍රේලියාවට ආවෙ මොන අවුරුද්දෙ ද?
**හේමන්ත**
1996 දී. ඉන් පස්සෙ ඔස්ට්‍රේලියාවේ නිර්මාණය කළ නාට්‍ය කීපයකට සම්බන්ධ වෙන්න අවස්තාව ලැබුණා.

**ශ්‍රීනාත්**
ඒ නාට්‍ය මොනවද?
**හේමන්ත**
හුනු වටයේ කතාව බක්මහ අකුණු නාට්‍යයේ මම ප්‍රේමදාසගේ චරිතය නිරූපනය කළා
මනමේ නාට්‍යයේත් මහාසාර නාට්‍යයේත් රඟපෑවා.
ඒ එක්කම ගුවන් විදුලි වැඩසටහන් වලටත් සහභාගි වුණා.
එල් බී ඒකනායක මහත්තයා ලියපු සිංගරු පාය ගුවන් විදුලි නාට්‍යයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයා විදිහට කටහඬ දුන්නා.

**ශ්‍රීනාත්**
තමුන්ගෙ කියලා ගීතයක් පටිගත කළේ මොන අවුරුද්දෙ ද?
**හේමන්ත**
1997. එහි සංගීතය සැපයුවේ කැමරන් කොළඹගේ. මහතායි. ඉන් එතැනින් පස්සෙ ගීත පටිගත කළේ නැද්ද?

**ශ්‍රීනාත්**
එතැනින් පස්සෙ ගීත පටිගත කළේ නැද්ද?
**හේමන්ත**
මම අවුරුද් ගණනාවක් ම හොඳ වැඩක් කරන්න පෙරුම් පුරමින් හිටියා. 97 ඉඳන් අවුරුදු 10 කට පස්සෙ ගීත කීපයක් පටිගත කරලා මගේම ප්‍රසංගයක් කරන්න මම උත්සාහ කළා.

**ශ්‍රීනාත්**
අපට කියන්නකො මේ ප්‍රසංගය ගැන.
**හේමන්ත**
මේක මගේ අවුරුදු ගාණක් තිස්සෙ හිතේ තිබ්බ ආසාවක්. 2007 මාර්තු 3 වන දින සවස 6 ට කෙල් වොට්සන් තියටර් එකේ හේමන්තයේ දී නමින් මගේ ප්‍රසංගය පවිතවනවා.
**ශ්‍රීනාත්**
මේ ප්‍රසංගය ඉදිරිපත් කරන්නෙ මොන ආකාරයට ද?
**හේමන්ත**
මෑතක ජනප්‍රිය වුණ ගායකයන් කීප දෙනෙකුගේ ගී සමගින් මගේම ගීත කීපයකුත් මෙහිදී මම ගායනා කරනවා. හෙම් සංගීතය සපයන්නේ කැමරන් කොළඹගේ ප්‍රමුඛ තරංගා වාදක කණ්ඩායමයි.

**ශ්‍රීනාත්**
සම්බන්ධ වෙන තවත් අය ඉන්නව ද?
**හේමන්ත**
මෙහි ඉන්න ප්‍රවීණ ගායිකාවන් කීපදෙනෙක් ම මට උදව් කරනවා. ඒඅ ය නම් සෙව්වන්දිකා අබේරත්න දිනෙල්කා දර්ශණී තිලකා රූපසිංහ අසුන්තා කරුණාරත්න ශිරෝමා ප්‍රනාන්දු කාංචනා පෙරේරා ඉඳුනිල් ලියනගේ මේ අය මගේ ආරාධනාව පිලිඅරගෙන මා සමඟ යුග ගී ගායනා කරනවා. මම ඒඅ යට මගේ ස්තූතිය පුද කරනවා.
**ශ්‍රීනාත්**
කවුද මේ ප්‍රසංගයට අනුග්‍රහය දක්වන්නෙ?
**හේමන්ත**
කව්රුවත් නැහැ ශ්‍රීනාත්. මම කාටවත් කරදර කරන්න ගියේ නැහැ. මෙහි සම්පූර්ණ වගකීම






සුඛ වග්ග

### නිවනට වැඩි තරම් සැපක් නැත

සැවැත් නුවර දෙව්රම් වෙහෙර

නත්ථි රාග සමෝ අග්ගි
නත්ථි දෝස සමෝ කලි
නත්ථි ඛන්ධසමා දුක්ඛා
නතථි සන්ති පරං සුඛං

රාගය තරම් දරුණු ගින්නක් මේ ලොව නැත
කෝපය තරම් දරුණු අපරාධයක් මේ ලොව නැත
පස් කඳ තරම් දරුණු දුක් දෙන දෙයක් මේ ලොව නැත
නිවන තරම් උතුම් සැපයක් මේ ලොව නැත

Natti raga samo aggi
Natti dosa samo kali
Natti kanda sama  dukka
Natti santi param  Sukam

There is no fire like lust
No crime like hate
There is no ill like the body
No bliss higher  than peace (nibbana)

### නිදානය

සැවැත් නුවර අඹුසැමි යුවලක් තුනුරුවන් කෙරෙහි බලවත් සැදැහැයෙන් වෙසෙති. ඔවුනගේ දියණියගේ විවා මගුල් දින දනක් පිරිනැමීම සඳහා බුදු හිමියන් ඇතුළු භික්ෂුන් වහන්සේලා සිය නිවසට වැඩමවා ගත්හ. මගුල් සහ අමවගුල් නිමිති කොට ගෙන දානමය පිංකම් කිරීම පෙර සිටම එන උතුම් සිරිතකි.
එදින බුදු හිමියන් ඇතුළු මහ සඟනට දන් පිළිගන්වන අය අතර මනාල මනාලි යුවලද වූහ. තම දෙමව්පියන් මෙන්ම ඒ මනාලිය වූ දුවද සැදැහැවත්ය.

මේ යුවලගේ මඟුල් යෝජනාවන් සිදුවී කලක් ගත වුවත් මනාලයාට සිය මනාලිය සිත් සේ බලා ගැනීමට අවස්ථාවක් ලැබී නොතිබිණ. සිය මනාලිය බුදු හිමියන් ඇතුළු මහ සඟනට දන් පිළිගන්වන අතර මනාලයාට තම මනාලිය සිත් සේ දැක බලා ගැනීමට අවස්ථාව විය. එවේලෙහි තම බිරිඳ වන මනාලිය කෙරෙහි රාග සිතකින් බලා සිටින්නට විය. මුහුණ, තොල්, දත්, පියයුරු, අඟ පසඟ මේ ආදී ඇගේ සිරුරෙහි හැඩ දකිමින් ඒවාට ලොල් කමින් ඒවායේ රස විඳින අයුරු අප බුදු හිමියන්ට දැනුණේය.

බුදු හිමියන්ගේ අධිෂ්ටාන බලයෙන් මනාලිය මනාලයාට පමණක් නොපෙනෙන සේ සැලසූහ. ඉන්පසු මනාලිය ගෙතුල ඇතැයි සිතා, වේගවත්වී ආ ඔහුගේ රාග සිත බොහෙ‍්දුරට නතර වුණේය. බුදුරජාණන් වහන්සේ දන් වළඳා අවසානයේදී මනාල යුවලටත් අන් අයටත් තැනට ගැලපෙන අයුරින් දහම් දෙසුහ.
මේ සිදුවීම නිමිති කොට ''රාගය සමවූ ගින්නක්වත්, කෝපය සම වූ අපරාධයක්වත්, පංචස්කන්ධය සම වූ දුකක්වත්, නිවනට වැඩිම තරම් වු සැපයක්වත් නැති බව'' වදාරා ඒ මනාල මනාලි යුවලට සෝවාන් මග පෙන්වාදී ඔවුනොවුන් යළි පෙනෙන සේ සැලසූ සේක.

## කවි කොළය

කැබිනට් ඇමතිකම වස ලැජ්ජයි! ලැජ්ජයි!
ඇත්තම කියන්නේ ගොවිකම් ඇමතිතුමා
මේ අවනඩුව ඇයි හොඳටම කළකිරිලා
ඇහුවම දීපු උත්තරයත් අසව් අසව්

වැටුනොත් හනස්සක් අරලිය ගහ වත්තේ
එයටත් ඇමති තනතුරු දෙන මෙහෙව් රටේ
රස්සාවකට වෙන යන්නෙත් කොහෙද ඉතින්
ලැජ්ජා නොමැති කම ඇමතිට වඩා ලොකුයි

**වෙත්තසිංහ**